# දඟ පැටියට අපූරු පාඩමක්



දිසුලි සෙයන්සා දොඹගොල්ල

දඟ පැටියට අපූරු පාඩමක්

කතා : දිසුලි සෙයන්සා දොඹගොල්ල
චිත්‍ර : දිසුලි සෙයන්සා දොඹගොල්ල

ISBN 978-624-208-674-3

# පිදුම

ආදරණීය විදුහල්පතිතුමියටත්,

අකුරු කියාදෙන පන්තිභාර ගුරුතුමියටත්,

පොත ලිවීම සඳහා උපදෙස් ලබාදුන් සියලුම ගුරු දෙමාපියන්ටත්,

මාගේ දෙමාපියන්ටත්,

මෙම පොත පුද කරමි.

## පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# දඟ පැටියට අපූරු පාඩමක්

එකෝමත් එක කාලෙක රෝසි කියලා ළමයෙක් හිටියා. එයාගේ සුරතල් බල්ලාගේ නම බෙකී. ඌ දුඹුරු පාටයි. ඒවගේම දඟයි.



හැමදාම උදේට බෙකීට කිරි එක දෙන්නේ රෝසී. රෝසී එයාගේ කිරි එක දෙනතුරු බෙකී බලාගෙන ඉන්නේ වලිගය වනමින් උඩ පැන පැන.



එයාට තිබුණා හරිම නරක පුරුද්දක්. ඒ තමයි වත්තට එන කුරුල්ලන්ව බය කරලා එළවනවා. ඒ දඟ හැරුණාම බෙකී හරිම කීකරු බලු පැටියෙක්. ඒ නිසා රෝසී මේ බලු පැටියට හරිම ආදරෙයි. බෙකිත් රෝසීට ඒ වගේම ආදරෙයි.



මුලු දවසම රෝසී එක්ක සෙල්ලම් කරන්න බෙකී හරිම කැමතියි. රෝසී පාඩම් වැඩ කරන වෙලාවටත් බෙකී රෝසීගේ උකුලට පනිනවා. සෙල්ලම් කරන්න. ඒත් රෝසී හොඳ ළමයෙක්. පාඩම් වැඩ සේරම ඉවර කරලා එයා බෙකී එක්ක සෙල්ලම් කරනවා.



දවසක් රෝසී චිත්‍රයක් අඳිමින් හිටියා. එක පාරටම බෙකී වැට පැත්තට දුවනවා රෝසී දැක්කා. එතකොටම බෙකී කෑගසනවා රෝසීට ඇසුණා. කුරුල්ලන් අල්ලන්න වැටෙන් පනින්න ගිහින් බෙකීගේ කකුල තුවාල වෙලා. රෝසි බෙකීට බෙහෙත් දැම්මා.

රෝසි ඇගේ අම්මාට මේ ගැන කිවුවා. ''අම්මේ බෙකී වැටෙන් පනින්න ගිහින් තුවාල වුණා. මම එයාගේ කකුලට බෙහෙත් දැම්මා.''



එවිට අම්මා ''මගේ දුව ගොඩක් හොඳ දරුවෙක්'' කියලා රෝසීට කිවුවා.



එදා ඉඳලා බෙකී මිදුලට එන කුරුල්ලන්ට කරදර නොකර ඉන්න පාඩමක් ඉගෙන ගත්තා

පුංචි අපිත් කිසිම කෙනෙකුට කවදාවත්ම හිරිහැර නොකර උපකාර කිරීමට පුරුදු වෙමු.



# ස්තූතිය

මා පුංචි කතුවරියක් කළ මහමායා බාලිකා විදුහල්පතිතුමියටත්, ප්‍රාථමික අංශයේ විදුහල්පති තුමිය හා පංතිභාර ගුරුතුමිය වන ප්‍රමිතා වෙත්තසිංහ ගුරුමැණියන්ටත්, අනෙකුත් ගුරු මැණිවරුන්ටත්, ගුරු පියවරුන්ටත්, අම්මාටත්, අප්පච්චි, අත්තා හා අත්තම්මාටත් මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි.



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔනැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්